12 (1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022/01/04 |
|---|---|---|

පැමිණිලිකරු : එන්. ජේ. එම්. ප්‍රියංකර නම්මුනිආරච්චිගේ මයා.
245/ජේ. පාල කුඩාව.
තලවිල පල්ලිය.
පුත්තලම.

වගඋත්තරකරුවන් : 01. සභාපති.
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.
වෝඩ් පෙදෙස.
කොළඹ 07.

02. විදුහල්පති.
බප/කැල ජනාධිපති විද්‍යාලය.
මහර- කඩවත.

**පැමිණිලි අංකය : එච්ආර්සී/930/2017**

**පැමිණිල්ල :-**

පෙත්සම්කරු මෙම පෙත්සම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ 2017-03-08 වන දින ඉදිරිපත් කර ඇති අතර. වැඩිදුර කරුණු දැක්වීම සඳහා ඔහු විසින් ඇමුණුම 01, 02, 03 සහ 04 යන අංක යොදමින් ලේඛණ 04ක්ද ඉදිරිපත් කර ඇත. ඔහුගේ මූල් පැමිණිල්ලට අමතරව 2017-07-04 දින සඳහන් ඌරුවල වීනිත ස්ථවිර ශ්‍රී සුමනකීර්ත මහා පිරිවෙන නාරංවල. ගම්පහ සහ මූළු දිවයිනට සාමවිනිසුරුවරයා ඉදිරියේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ද කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

එකී මුල් පැමිණිල්ල සහ දිවුරුම් ප්‍රකාශය මගින් පෙත්සම්කරු පවසා සිටින්නේ 2011 වසරේ අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා බප/කැල කැළණිය ජනාධිපති විද්‍යාලයෙන් පෙනී සිටීමෙන් අනතුරුව උසස් පෙළ අධ්‍යාපන සඳහා පාසල් අයදුම්කරුවෙකු ලෙස පෙනී සිටීමට තරම් ප්‍රමාණවත් සාමාර්ථයක් නොලැබුණු නිසා 2011 දෙසැම්බර් මාසයෙන් පසු ඔහු පාසල් අධ්‍යාපනයෙන් සමුගත් බවත්ය. තවද අධ්‍යාපනය කෙරෙහි ඇති වූ උනන්දුව මත 2015 වසරේදී පැමිණිලිකරු පදිංචිව සිටි පුත්තලම, කල්පිටිය ප්‍රදේශයෙන් බාහිර අයදුම්කරුවෙකු ලෙස සියලූ අවශ්‍යතා සම්පූර්ණ කර උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි බවත්, එකී විභාගයෙන් ප්‍රතිඵල මත පුත්තලම දිස්ත්‍රික්කයෙන් සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලීය නර්ථන පාඨමාලාව සඳහා වූ අවම Z අගය (0.7776) සිට (0.2000) අතර ඔහුගේ Z අගය (0.7623) පැවති බවත්, විශ්ව විද්‍යාල විශේෂ ප්‍රවේශයට අදාල සමස්ථ ලංකා හා ජාතික මට්ටමේ ප්‍රථම ස්ථානය ලබා ගත් සහතික පසු ගිය වසර 03ට අදාලව රාශියක්ද ඔහු සතුව තිබූ බවත්, එම පාඨමාලාවට අදාල ප්‍රායෝගික පරීක්ෂණයෙන්ද සමත්ව සිටි බවත්, තවදුරටත් පවසා සිටියි.

පැමිණිලිකරු බප/කැල කැළණිය ජනාධිපති විද්‍යාලයෙන් ලබා ගත් ශිෂ්‍ය කාර්ය දර්ශකයෙහි (පාසල් අස්වීම් සහතිකය) පාසලෙන් අස් වූ දිනය වැරදි ලෙස සටහන් කොට තිබීම නිසා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව 2015 විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා පැමිණිලිකරු ගම්පහ දිස්ත්‍රික්කයේ අයදුම්කරුවෙකු ලෙස තීරණය කොට විශ්ව විද්‍යාල පිවිසීමේ වරම ඔහුට අහිමි කල බවත්ය.

තවද, පැමිණිලිකරු ඔහුගේ මෙම දුක්ගැනවිල්ල පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සහා අභියාචනා මණ්ඩලයටද අභියාචනයක් ඉදිරිපත් කර ඇතත්, එහිදී ද ඔහුට සාධාරණයක් ඉටු නොවූ බව පෙන්වා දෙන ලදී. එබැවින් පෙත්සම්කරු මෙම පෙත්සම මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරමින් සියලූ කරුණු වල නිර්වද්‍යතාවය සලකා බලා ඔහු පෙනී සිටින දිස්ත්‍රික්කය නිසි අයුරින් නිරීක්ෂණය කොට විශ්ව විද්‍යාල ප්‍රවේශයට අවස්ථාව ලබා දෙන ලෙස ඉල්ලා සිටියි.

පැමිණිලිකරුගේ මෙම පෙත්සම පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් කිරීමට තීරණය කර ඇති අතර, 2017-08-03, 2017-09-22 සහ 2017-11-27 යන ආදී දිනයන් හි පරීක්ෂණය සිදු කර ඇති අතර, 2017-11-27 දින පැවැත් වූ පරීක්ෂණයේදී පාර්ශවකරුවන් විසින් දීර්ඝ වශයෙන් කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කර ඇත.

තවද වගඋත්තරකරු විසින් මෙම පෙත්සම පිළිබඳව 2017-10-17 දිනැති සහ UGC/AD/14/2015/2016 අංක දරණ වාර්තාවක් ද මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. එකී වාර්තාවෙන් වගඋත්තරකාර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙනුවෙන් පවසා සිටින්නේ 2015/2016 අධ්‍යාපන වර්ෂය සඳහා විශ්ව විද්‍යාල ප්‍රවේශ සලකා බැලීමේදී දිස්ත්‍රික්කය නිර්නය කිරීම ප්‍රවේශ අත්පොතෙහි 1.5 ඡේදයට අනුව තීරණය කරන බවත්, එම ඡේදයට අනුව විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අපේක්ෂයකු කුමන ප්‍රදේශයට අයත් වන්නේ ද යන්න තීරණය කිරීම සඳහා අපේක්ෂකයා අවසන් වර්ෂ 03ක කාල පරිච්ඡේදය

තුළ අධ්‍යාපනය ලැබූ පාසල පිහිටා ඇති දිස්ත්‍රික්කය සලකා බලන බවත්. අපේක්ෂකයා විසින් අයදුම් පත්‍රයෙ සඳහන් කර ඇති තොරතුරු වල නිර්වද්‍යතාවය පාසල් වාර්තා ආශ්‍රයෙන් පාසල් ප්‍රධානිය විසින් සහතික කල යුතු බවද දන්වා සිටියි.

ඒ අනුව පෙත්සම්කරු අ.පො.ස (උසස් පෙල) විභාගයට පෙනී සිටි දිස්ත්‍රික්කය නිර්නය කිරිමේදි ඔහු විසින් ප්‍රවේශ අයදුම්පත සමග එවන ලද පාසල් ශිෂ්‍ය කාර්ය දර්ශනය අනුව ඔහු මහර ජනාධිපති විද්‍යාලයට ඇතුලත් වූ දිනය 2010-05-10 හා එම පාසලෙන් අස්වූ දිනය ලෙස 2014-01-22 දින ලෙස සඳහන් කරමින් එම විදුහලේ විදුහල්පති ටි.බි.සි. සමරනායක මහතා ඔහුගේ අත්සනින් හා නිල මුද්‍රාව සඳහන් කරමින් නිකුත් කර ඇති බවද, එකී ලේඛණය ඇමුණුම් 01 ලෙස වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති බව පෙන්වා දෙයි.

තවද පාසලෙන් අස් වූ දිනය හා ශිෂ්‍ය කාර්ය දර්ශනය නිකුත් කල දිනය එකම දිනයක් බැවින්. ඒ පිළිබඳව නැවත වරක් රහස්‍ය වාර්තාවක් ලබා දෙන ලෙස අදාල විදුහලේ විදුහල්පති වෙත 2016-07-20 දින ලිඛිත ඉල්ලීමක් කර ඇති අතර. එම වාර්තාව පුරවන ලද පි.එස්.ටි.එස්.ඩි ද සේරම් විදුහල්පතිනිය සඳහන් කර ඇත්තේ පැමිණිලිකරු 2010-10-10 සිට 2014-01-22 දින දක්වා එම පාසලේ ඉගෙනුම ලබා ඇති බවත්. එකී රහස්‍ය වාර්තාවේ පිටපතක් ඇමුණුම 02 ලෙස සඳහන් කොට කොමිපන් සභාවට ඉදිරිපත් කොට ඇත.

වගඋත්තරකරු තවදුරටත් කියා සිටින්නේ පවතින ප්‍රවේශ නීතිරිති වලට අනුව 2015 අ.පො.ස (උසස් පෙළ) සඳහා 2012-08-01 දින සිට 2015-07-31 දින දක්වා යම් අපේක්ෂකයකු අධ්‍යාපනය ලැබීම සඳහා වසරකට වැඩි කාලයක් ඇතුලත් වූ පිහිටි දිස්ත්‍රික්කය ඔහුගේ / ඇයගේ දිස්ත්‍රික්කය වේ. එනම් මෙම කාල පරිච්ජේදය තුළ පෙත්සම්කාර ශිෂ්‍යයා වසරකුත් මාස 05ක් සහ දින 21ක් මහර ජනාධිපති විද්‍යාලයේ ඉගෙනුම ලබා ඇති බව දිස්ත්‍රික්කය නිර්නය කිරිමේදි තිරණය කර ඇත. ඒ අනුව පෙත්සම්කාර ශිෂ්‍යාගේ පාසල පිහිටා ඇත්තේ ගම්පහ දිස්ත්‍රික්කය බැවින්. විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා ඔහුගේ දිස්ත්‍රික්කය ගම්පහ දිස්ත්‍රික්කයද බවද වගඋත්තරකරු පවසා සිටියි.

තවද 2015/2016 අධ්‍යනය වර්ෂයේ කඩඉම් ලකුණු නිකුත් වූයේ 2016-09-20 දිනය කඩඉම් ලකුණු අනුව පෙත්සම්කාර ශිෂ්‍යා ඔහු සලකා බලන ගම්පහ දිස්ත්‍රික්කයෙන් කිසිදු පාඨමාලාවකට හෝ විශ්ව විද්‍යාලයකට සුදුසුකම් ලබා නොතිබූ බව ද කඩඉම් ලකුණු නිකුත් විමෙන් පසු  අදාල පෙත්සම්කාර සිසුවා අභියාචනාවක් සමග නැවත වරක් ශිෂ්‍ය කාර්ය දර්ශනයක් අප වෙත යොමු කර ඇති අතර. එහි විද්‍යාලයෙන් අස් වූ දිනය ලෙස 2011-12-31 සඳහන් කරමින් පි.එස්.පි.එස් ඩි. ද සේරම් විදුහල්පති ඇයගේ අත්සන යටතේ නිකුත් කර ඇති බවද එකී ලේඛණය ඇමුණුම 03 ලෙස සඳහන් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත.

තවද වගඋත්තරකරු පවසා සිටින්නේ පි.එස්.පි.එස් ඩි. ද සේරම් විදුහල්පතිතුමිය අවස්ථා දෙකකදි වර්ෂ දෙකක් සඳහන් කරමින් අස්විම් සහතික නිකුත් කර ඇති බවද. විශ්ව විද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් දිස්ත්‍රික්කය නිර්නය කිරිමේදි විශාල ගැටළුවක් පෙනී යන බැවින් ද. මෙම අභියාචනය 2016-11-07 දින පැවැති අභියාචනා කමිටුවට යොමු කල අතර. අභියාචනා

කමිටුව මගින් මෙය සිතාමතා සිදු කල ක්‍රියාවක් බැවින්, පෙත්සම්කාර ශිෂ්‍යාගේ අභියාචනය ප්‍රතික්ෂේප කල අතර, ඔහුගේ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සලකා බැලිය යුතු දිස්ත්‍රික්කය ගම්පහ විය යුතු බව තවදුරටත් තිරණය කල බවද පවසන ලදි.

තවද 2017-11-27 වන දින පැවැති පරීක්ෂණයට සහභාගි වූ බප/කැල ජනාධිපති විද්‍යාලයේ විදුහල්පතිනිය වන පි.එස්.පි.එස් ඩී. ද සේරම් මහත්මිය ප්‍රකාශ කර සිටින ලද්දේ පෙත්සම්කාර සිසුවාගේ අස්වීම් සහතිකයේ අස් වූ දිනය ලෙස සඳහන්ව තිබුණේ 2014-01-22 දින බවත්, පාසලට ඇතුලත් වීමේ ලේඛණයේ ඒ බව ලිඛිත සටහනක් කර ඇති බවත්, නමුත් මෙම සිසුවා විසින් පසුව මෙම ගැටළුව පිලිබඳ පැහැදිලි කර ඔහු 2011 වර්ෂයේදී විද්‍යාලයෙන් ඉවත් වූ බව සඳහන් කිරිමත් සමග ඒ පිලිබඳව පරීක්ෂා කල බවත්, ඒ අනුව පෙත්සම්කාර ශිෂ්‍යා 2011 වසරේ 11 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබා ඇති බවත්, ඉන් පසුව 12 හා 13 ශ්‍රේණි සඳහා මෙම විද්‍යාලයේ අධ්‍යාපනය ලබා නොමැති බවත්, ඒ අනුව ඔහු පාසලෙන් අස් වූ දිනය 2011 වසරේ විය යුතු බවත් ප්‍රකාශ කර සිටියි.

එකී ප්‍රකාරව පෙත්සම්කාර ශිෂ්‍යාගේ ඉල්ලීම මත අස්වීමේ සහතිකය නැවත නිවැරදි කර පාසලෙන් අස් වූ දිනය 2011-12-31 වන දින නැවත සකස් කොට 2016-10-04 වන දින එය නිකුත් කර ඇති බව ද ප්‍රකාශ කර සිටියි. තවද විදුහල්පතිනිය විසින් ඇය ඉදිරිපත් කර ඇති මෙම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැවැති පරීක්ෂණයේදී ප්‍රකාශ කර සිටියි.

**වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

2017-11-27 දින පැවැති පරීක්ෂණයේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටින ලද නිලධාරින් වැඩිදුරටත් පවසා සිටියේ මෙම ශිෂ්‍යා පුත්තලම දිස්ත්‍රික්කයෙන් සලකා බැලුවත් ඔහුට සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ නර්තන විෂය සඳහා ප්‍රමාණවත් Z ලකුණු 2015 / 2016 වර්ෂය සඳහා සපුරා නොමැති බැවින්, අවම කඩඉම් ලකුණු 0.7776 අවශ්‍යව තිබුණද පැමිණිලිකරු 2015 / 2016 සඳහා ලබා ගෙන ඇති Z ලකුණු 0.7622 බැවින්ද, පෙත්සම්කාර ශිෂ්‍යා ඒ සඳහා ද අවස්ථාවක් ලබා ගෙන නොමැති බවත්ය.

පෙත්සම්කාර ශිෂ්‍යා විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අයදුම්පත් ඉදිරිපත් කිරිමේදී හා අභියාචනා පරීක්ෂණයේදී ද ඔහු විසින් ජාතික / සමස්ථ ලංකා ජයග්‍රහණ, පලාත් මට්ටමේ ජයග්‍රහණ, දිස්ත්‍රික් මට්ටමේ ජයග්‍රහණ සහ කලාප මට්ටමින් ලැබූ ජයග්‍රහණ පිලිබඳව සහතික ද ඊට අදාල හසුරු සටහනද ඉදිරිපත් කර ඇත. එම සහතික පත්‍ර පෙත්සම්කාර ශිෂ්‍යා විසින් කොමිෂන් සභාවට ද ඉදිරිපත් කර ඇති අතර, ඔහු විසින් ජාතික / සමස්ථ ලංකා ජයග්‍රහණ ලැබූ අවස්ථාවන් 09 ක්ද තිබෙන බවත්, මනා පැහැදිලි වේ.

01. අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන සංගීත හා නර්තන තරගාවලිය - 2015

විවෘත - ඒකල - උඩරට මඟුල් බෙර වාදනය - ප්‍රථම ස්ථානය

02. ශ්‍රී ලංකා යුත් ජාතික සම්මාන උළෙල - 2013

ඒකල - පිරිමි - සාම්ප්‍රදායික උඩරට බෙර වාදනය - ප්‍රථම ස්ථානය

03. අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන සංගීත හා නර්තන තරගාවලිය - 2013

විවෘත - ඒකල - උඩරට මඟුල් බෙර වාදනය - ප්‍රථම ස්ථානය

04. ශ්‍රී ලංකා යුත් ජාතික සම්මාන උළෙල - 2012

ඒකල - පිරිමි - ගැටබෙර වාදනය - ප්‍රථම ස්ථානය

05. අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන සංගීත හා නර්තන තරගාවලිය - 2021

විවෘත - ඒකල - නාට්‍යමය පෙළපාළි - ප්‍රථම ස්ථානය

06. අන්තර් සංස්කෘතික මධ්‍යස්ථාන සංගීත හා නිර්තන තරගාවලිය - 2011

විවෘත - ඒකල - බෙර වාදනය -ප්‍රථම ස්ථානය

07. සමස්ථ ලංකා පාසල් නැටුම් හා මුද්‍රා නාට්‍ය තරගය - 2011

ජ්‍යෙෂ්ඨ - ඒකල - පිරිමි- උඩරට මඟුල් බෙර වාදනය - ප්‍රථම ස්ථානය

08. රාජ්‍ය නර්තන උළෙල - 2021

ළමා - මිශ්‍ර - තුරගා වන්නම - දෙවන ස්ථානය

09. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කල ප්‍රථම ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති

ඇසළ මහා සිසු පෙරහැරට සහභාගීවීම - 2011

ඉහත කී ජයග්‍රහණ හැර පෙත්සම්කාර ශිෂ්‍යා පලාත් දිස්ත්‍රික් සහ කලාප මට්ටමින් ද ජයග්‍රහණ රාශියක් ඇති කර ගෙන ඇති බවද, ලේඛණ වලින් පැහැදිලි වේ.

මෙම අවස්ථාවේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ප්‍රථම උපාධි පාඨමාලා සඳහා මෙම පෙත්සම්කාර ශිෂ්‍යාට අදාල වන ප්‍රවේශ අත්පොතෙහි 4 කොටසෙහි ( විශේෂ විධිවිධාන යටතේ සිසුන් ඇතුලත් කර ගැනිම )

4.2 අධ්‍යයන කටයුතු හැර වෙනත් ක්ෂේත්‍රයන් හි විශිෂ්ඨතාවයෙන් ඇති සිසුන් යන උප මාතෘකාව යටතේ ද,

" සෑම අධ්‍යයන පාඨමාලාවකම ඇති ස්ථාන වලින් 0.5 % ක ප්‍රමාණයක් දක්වා එකග වී ඇති මුළු ස්ථාන සංඛ්‍යාවට යටත්ව සුළු ඉසෙඩ් ලකුණු සංඛ්‍යාවක අඩුවක් නිසා සාමාන්‍ය ප්‍රවේශය යටතේ යම් කිසි පාඨමාලාවකට නොතේරුණු, එහෙත් ක්‍රීඩා, සෞන්දර්ය සහ සංස්කෘතික කටයුතු ( උදා : සංගීතය, නැටුම්, චිත්‍ර, කලා සහ සහිත්‍ය ) බාල දක්ෂ සහ ශිෂ්‍යහට, සමාජ කටයුතු හා වෙනත් බාහිර ක්‍රියාකාරකම් වලින් 2021.08.01 දින සිට 2015.07.31 දක්වා කාලය තුල ජාතික මට්ටමේ ප්‍රථම, දෙවන හෝ තෙවන ස්ථාන හෝ ජාත්‍යන්තර මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන ඇති ශිෂ්‍යයන්ට පිරිනැමේ."

පෙත්සම්කාර ශිෂ්‍යාගේ ශිෂ්‍යකාර්ය දර්ශකයෙහි පාසලෙන අස් වූ දිනය වැරදීමකින් 2014-01-22 යන සදහන් වුවත්, එම දිනය නියම වශයෙන්ම 2011-12-31 විය යුතු බව එවකට කැලණිය ජනාධිපති විද්‍යාලයේ හිටපු විදුහල්පතිනි පි. එස්. පි. එස්. සේරම් මහත්මිය පවසා සිටියි. තවද නියත වශයෙන්ම පෙත්සම්කාර ශිෂ්‍යා පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවෙක් බවට ද ඔහුට අවුරුදු 03 කාලයක සිට පුත්තලම දිස්ත්‍රික්කයේ කල්පිටිය ප්‍රදේශය තුළ ජිවත් වන බවට 2016.06.05 දින ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය හා චරිත සහතිකයෙන් තහවුරු වේ. මීට අමතරව පෙත්සම්කාර ශිෂ්‍යා විසින් අවස්ථා දෙකකදී කොමිෂන් සභාවට ලබා දුන් දිවුරුම් ප්‍රකාශ දෙකක් මගින්ද, ඡන්ද හිමි නාමලේඛණය සහතික කරන ලද උපුටනය ඔහු පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිකරුවෙකු බවද අනාවරණය වේ. ඒ අනුව බැලීමේදී පෙත්සම්කාර ශිෂ්‍යාගේ දිස්ත්‍රික්කය පුත්තලම දිස්ත්‍රික්කය බවට මානව හිමිකම් කොමිෂන් සභාවේ මතය වේ. තවද, විශ්ව විද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි 4 කොටසෙහි 4.2 අධ්‍යනය කටයුතු හැර වෙනත් ක්ෂේත්‍රයෙහි විශිෂ්ඨතාවයක් ඇති සිසුන් ගණය යටතේ මෙම පෙත්සම්කාර ශිෂ්‍යාගේ ජාතික / සමස්ථ ලංකා මට්ටමින් ලැබූ අදාල ජයග්‍රහණ පිළිබඳ සහතික විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පරීක්ෂාවට ලක් කර නොමැති බව පැහැදිලි වේ.

ජාතික මට්ටමෙන් අදාල සෞන්දර්ය ක්ෂේත්‍රයේ ප්‍රථම ස්ථාන රාශියක් ලබා ගත් මෙම ශිෂ්‍යා ක්ෂේත්‍රයෙහි විශේෂතාවයක් ඇති සිසුන් ගණය යටතේ සලකා බලා තිබුණේ නම්, මෙම ශිෂ්‍යාවට ද අදාල වර්ෂයට අවශ්‍ය වූ ඉසෙඩ් අගය ද පසු කරලීමට අවස්ථාව ද ඉන් අනතුරුව පුත්තලම දිස්ත්‍රික්කයෙන් අදාල වර්ෂයට විශ්ව විද්‍යාලයට ඇතුලත් වීමට වරම් ලැබීමට ද අවස්ථාවක් තිබූ බවද කොමිෂන් සභාවේ මතය වේ.

**කොමිෂන් සභාවේ නිරීක්ෂණ :-**

ඉහත කී සියලු කරුණු කාරණා සලකා බැලීමේ දී පෙත්සම්කාර ශිෂ්‍යා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ප්‍රථම උපාධි පාඨමාලාව සඳහා ප්‍රවේශ අත්පොතෙහි 4 කොටසෙහි 4.2 විෂය පරිභාහිර කටයුතු සඳහා විශිෂ්ඨතාවයක් ඇති සිසුන් ඇතුලත් කර ගැනීමට අදාල අයදුම්පත්‍රයද සම්පූර්ණ කර භාර දෙන ලද්දේ උසස් පෙළ විභාගයට පෙනී සිටින අධ්‍යයන වර්ෂ 03 ඇතුලත් ජාතික මට්ටමේ තරගාවලි බොහෝමයකින් ප්‍රථම ස්ථානය ලබා විශේෂ ප්‍රවේශයට සුදුසුකම් ද සපුරා තිබීමෙන් පසුවද ඔහුගේ දිස්ත්‍රික්කය පුත්තලම දිස්ත්‍රික්කය බවට ද සලකා බැලීම විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අවධානයට යොමු වියයුතු කරුණු බවද නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මෙම සමස්ථ කරුණු අනුව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12.1 වගන්තියේ සඳහන් නීතිය ඉදිරියේ සමානාත්වයෙන් සැලකීම යටතේ වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝණය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පෙත්සම්කාර ශිෂ්‍යා ඔහුගේ අධ්‍යාපන හා අනිකුත් සුදුසුකම් මත ඔහුට අදාල පාඨමාලාව හැදෑරීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රවේශය ලබා දිය යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022.02.04 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම. හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ඩ/-

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka